## පළමුවන දේව ප්‍රකාශනය

බාරුක් 5:1-9

බාරුක් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(මිහිපිට සෑම ජාතියකට ම ඔබේ මහිමය පෙන්වනු ලබන්නේ ය.)**

එම්බා, ජෙරුසෙලම් නගරය, දුක් වේදනාවේ වස්ත්‍රය ඉවතලා, දෙවි මහිමයේ ශෝභනකම සදහට ම ඇඟලාගන්න. දේව අවංකකම නමැති සළුව පැළඳගන්න. ඔබ සිරස මත සදාතනිකයාණන්ගේ තෙදබල කිරීටය තබාගන්න. මන්ද, මිහිපිට සිටින සෑම ජාතියකට ම ඔබේ මහිමය පෙන්වීමට දෙවිඳාණෝ සලසන සේක. දෙවිඳාණන් ඔබට දෙන නාමය සදා පවතින්නේ ය. සාමය උදාවූයේ අවංකකමිනි. ගෞරවය උදාවූයේ ලැදිකමිනි. ජෙරුසෙලම, නැගිට උස් තැන්හි සිට ගන්න. ඔබේ දෙනෙත් පෙරදිගට හරවන්න. සුවිශුද්ධ තැනැන්වහන්සේගේ අණට එකඟව පෙර අපර දෙදිගින් රැස්වී සිටින ඔබේ දරුවන් දෙස බලන්න. දෙවිඳාණෝ ඔවුන් සිහිපත් කළ සේක කියා ඔව්හු ජයගොස නගති. සතුරන් නමැති පිරිවර ඇතිව ඔව්හු පයින් පිටත් වී ගියහ. එහෙත් දැන්, තේජාන්විත ව, උසුලාගෙන යන රජකුමරුන් මෙන් දෙවිඳාණෝ ඔවුන් ඔබ වෙත ගෙනෙන සේක. මන්ද, දේව මහිමාලංකාරයෙහි සුවසේ ඉශ්රායෙල් ජනයා ගමන් කරන පිණිස දෙවිඳාණන් සියලු උස් කඳුවලට ද සදාතන කඳුවලට ද සම භූමියක් වීමටත්, මිටියාවත් පිරී සමතලා භූමියක් වීමටත් නියම කර ඇත. දේව අණට එකඟ ව වන රොද හා සෑම සුවඳ කුසුම් ගසක් ඉශ්රායෙල් ජනයා හට සෙවන දෙනු ඇත. දේව දයාව සහ අවංකකම පිරිවර මෙන් ඇතිව ස්වකීය මහිමාලෝකයෙහි ප්‍රීතියෙන් යාමට ඉශ්රායෙල් ජනයාට මඟ පෙන්වන සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 126:1-6

පිළිතුර: සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක.

ගීය: සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය. එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු.

එවිට, "සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ"යි විජාතීහු කියන්නට ගත්හ. සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වෙමු.

සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇළදොළ මෙන් අපට යළි ගෙන දුන මැනව. දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙලා ගන්නෝ ය.

ඔව්හු වී මළු රැගෙන කඳුළු සල සලා පිටත්ව ගිය නමුත්, තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## දෙවන දේව ප්‍රකාශනය

පිලිප්පි 1:3-6, 8-11

පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනය සඳහා නිදෙස්ව අවංකව සිටින්න.)**

මට ඔබ සිහි වන සෑම විට ම මම මාගේ දෙවියන් වහන්සේට ස්තුති කරමි; මා යාච්ඤා කරන සෑම විට ම, ඔබ සියලු දෙනා උදෙසා යාච්ඤා කරමින් ප්‍රීතියෙන් පිරී සිටිමි. මා එසේ කරන්නේ පළමු දවස පටන් මේ වන තුරු ධර්මදූත සේවයට ඔබ සහභාගි වූ නිසා ය. ඔබ තුළ යහපත් කාර්යයක් ඇරඹූ උන් වහන්සේ, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ පැමිණීමේ දවස දක්වා එය සම්පූර්ණ කරනු ඇතැ යි මම ඒකාන්තයෙන් ම විශ්වාස කරමි. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ සෙනෙහසින් මා ඔබට සැබැවින් ම ප්‍රේම කරන බව දෙවියන් වහන්සේ දන්නා සේක. ඔබ උදෙසා මාගේ යාච්ඤාව මේ ය: විශිෂ්ටතම දේවල් වටහාගැනීමට හැකි වන පිණිස, දැනගැන්මෙන් හා සියලු ආකාර විමසීමෙන් ඔබගේ ප්‍රේමය බොහෝසෙයින් වර්ධනය වේ වා; ක්‍රිස්තුන් වහන්සේගේ දවස දක්වා අවංක ව හා නිදෙස් ව සිටීමට ඔබට හැකි වේවා. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ ගෞරවය හා ප්‍රශංසාව පිණිස ඔබ දැහැමි ජීවිතයක ඵල වලින් පූර්ණ වේවා.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 3:4,6

ආලේලූයා! ආලේලූයා!
"සමිඳුන්ගේ මඟ පිළියෙළ කරන්න, එතුමන් හට ඇද නැති මාවත් සාදන්න. දෙවියන් කෙරෙන් වන විමුක් මඟ මනු සත දකිනු ඇතැ"යි පාළුකරයෙහි මොරගා කියන හඬෙකි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 3:1-6

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(සව්සත දෙවියන් කෙරෙන් වන විමුත් මඟ දකිනු ඇත)**

තිබේරියස් අධිරාජයා රජ පැමිණි පසළොස් වන අවුරුද්දෙහි පොන්තියස් පිලාත් ජුදයට ආණ්ඩුකාරයා ව ද හෙරොද් ගලීලයට යුවරජ ව ද ඔහුගේ සහෝදර පිලිප් ඉතුරයටත්, ත්‍රිකොනියටත් යුවරජ ව ද ලුසානියස් අබිලේනියට යුවරජ ව ද අන්නස් හා කායාපස් උත්තම පූජකවරයන් ව ද සිටි සමයෙහි, දෙවියන් වහන්සේගේ පණිවුඩය පාළුකරයෙහි සෙකරියස්ගේ පුත් ජොහන් වෙත පැමිණියේ ය. තවද, ඔහු ජොර්දන් ගඟ අවට පෙදෙස මුළුල්ලෙහි සැරිසරමින්, පව් කමාව පිණිස පසුතැවී සිත් හරවා ගෙන බව්තීස්ම-ස්නාපනය ලබන්නැ යි ප්‍රකාශ කෙළේ ය. එපවත් දිවැසිවර යෙසායාගේ ලියවිලිවල මෙසේ ලියා ඇත: "සමිඳුන්ගේ මඟ පිළියෙළ කරන්න, එතුමන් හට ඇද නැති මාවත් සාදන්න. සියලු කඳුරැළි පුරවනු ලැබේ; සියලු කඳු හා හෙල් සමතලා කරනු ලැබේ; සියලු වංගු ඇද හරිනු ලැබේ; රළු මාවත් මට්ටම් කරනු ලැබේ. දෙවියන් කෙරෙන් වන විමුත් මඟ මනු සත දකිනු ඇතැ යි පාළුකරයෙහි මොරගා කියන හඬෙකි."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.